ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2012 මැයි මස 27 වැනි දින |

## ද ෆිනෑන්ස් සමාගම පිළිබඳව කර ඇති වැරදි පුවත් සම්බන්ධව මහජනයා දැනුවත් කිරීමයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කරනු ලබන දෙපාර්තමේන්තුව ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මහ බැංකුව විසින් බලපත්‍ර ලබා දී ඇති සියලු මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳව අඛණ්ඩ අධීක්ෂණයක නියැලී සිටී.

දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මට අනුව, ද ෆිනෑන්ස් සමාගම ඉතා සාර්ථකව එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් පවතී. මේ අනුව මෙම සමාගමේ මුළු මහජන තැන්පතු 2011 අප්‍රේල් මාසයේ සිට 2012 අප්‍රේල් මාසය වන විට සියයට 5.36 කින් ඉහළ නංවාගෙන ඇති අතර, සිය මුළු ණය දීම් ප්‍රමාණය 2011 අප්‍රේල් මාසයේ සිට 2012 අප්‍රේල් මාසය වන විට සියයට 11 කින් ඉහළ නංවා ඇත. එසේම, ද ෆිනෑන්ස් සමාගම මෙම ප්‍රතිව්‍යුහගත සැලැස්ම ක්‍රියාත්මක වීමට පෙර වාර්තා කර තිබූ ඇඩි අලාභ තත්ත්වයන් මගහරවමින් සමාගම දැනට ලාභ ලැබීමේ මාර්ගයට ප්‍රවිශ්ඨ වී ඇත.

තවද, ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මේ මූලික අංගයක් ලෙස එය ක්‍රියාත්මක කරන

අවස්ථාවේ, ද ෆිනෑන්ස් සමාගමේ නව කොටසක් රුපියල් 40/- ක මිලකට 2011 වසරේ දී නිකුත් කරන ලද අතර, පසුව එය රුපියල් 48/- දක්වා ඉහළ ගොස් ඇත. නමුත්, සමස්ත කොටස් වෙළෙඳපොළ කොටස් මිල ගණන් පහත වැටීමත් සමග, ද ෆිනෑන්ස් සමාගමේ කොටස්වල මිල පසුව අඩු වී ඇත. එසේ වුවද, ද ෆිනෑන්ස් සමාගම මුළු වත්කම් වටිනාකම් අනුව ප්‍රධාන මුදල් සමාගම් පහ අතර සිටිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද කොන්දේසි සපුරාලමින් ප්‍රතිව්‍යුහගත සැලැස්මේ අභිමතයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරමින් සිටී.

එබැවින් විවිධ පුද්ගලයන් විසින්, ද ෆිනෑන්ස් සමාගම සම්බන්ධව දේශපාලන අරමුණු පදනම්කොට ගෙන කරනු ලබන ප්‍රකාශයන්ට මුලානොවන ලෙස මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.